

වලස් පැංචා
ෂෙනාල් චාරුක කොඩිකාර

# වලස් පැංචා

**ෂෙනාල් චාරුක කොඩිකාර**

**4 වන ශ්‍රේණිය B**

**මහ/සිද්ධාර්ථ මහා විද්‍යාලය**

**( කතෘගේ පළමු එළිදැක්වීමයි )**

**කෘතිය එළකරන දිනය 2025.02.08**

**ISBN අංකය : 978-624-208-7054**

# <u>පිදුම</u>

දෙඇස් පහදා මෙලොව

බුද්ධියෙන් හා මනුෂ්‍යත්වයෙන් පිරිපුන් පුතණුවන්

බිහිකිරීමට වෙර දරණ දයාබර දෙමාපියන්ටත්,

ගුරු මෑණිවරුන්ටත් , ගුරු පියවරුන්ටත් මේ පොත

සෑදීමට මා මෙහෙයවූ සැමට සඳබැඳි ගෞරවයෙන් යුතුව

මෙම පොත පිළිගන්වමි.

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණිය යුග කැපී පෙනෙන්නේද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාල පරිච්ඡේද නිසාය. එසේ නම් මහමායා ඉතිහාසයේද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම ඊට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩනඟා ඒ රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදී කතෘ කරඳන අත්තදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩ නගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද ග්‍රන්ථකරණයට යොමු කරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනය සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක්ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනා ගනිමින් ලේඛනකරණයට යොමු වීමේ ප්‍රතිඵලයක් ලෙස එළි දකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර
මහාමායා බාලිකා විද්‍යාලය මහනුවර

එකෝමත් එක රටක වලස් පැංචෙක් හිටියා. මේ වලස් පැංචා මස් කන්නෙ නෑ. ඒක නිසා වලස් තාත්තා වලස් පැංචාට නිතරම බනිනවා.




එක දවසක් වලස් පැංචා ලෙඩ වුණා.



මී පැණි කැවොත් නම් මට ශක්තිය ලැබෙයි.



මට යාළුවන් එක්ක සෙල්ලම් කරන්න පුළුවන් කියා සිතුනා.



වලස් තාත්තාට හොරෙන් ගිහින් මී පැණි කෑවා.



මී පැණි කෑවට හොඳවුණේ නෑ ලෙඩය මදිවට දත් කැක්කුමත් ආවා.



වලස් තාත්තාට මේක ආරංචි වුණා. ඒක නිසා වලස් තාත්තා කිව්වා. “ ඔයා දුර්වල වුනේ මස් කාපු නැති නිසා ” කිව්වා.



“ හා හා මම අද ඉඳන් මස් කනවා” කීවා. වලස් පැංචා අමාරුවෙන් මස් කන්න පුරුදු වුණා.



“ මගේ ලෙඩ හොඳ වුණා. ගොඩක් මී පැණි කාපු නැති නිසා දත් කැක්කුම ආවෙත් නෑ. ” වලස් පැංචා දැන් සුවෙන් හා සතුටෙන් ඉන්නවා.



තාත්තා කියූ දේ ඇසූ නිසයි අද මම සතුටෙන් ඉන්නේ. " ස්තුතියි තාත්තේ " වලස් පැංචා කිව්වා.



# ස්තූතිය

“ වලස් පැංචා ” කෘතිය රචනා කිරීමට මා දිරිගැන්වූ මගේ අම්මාටත්,තාත්තාටත් “ හෙරණගත්කරණී ” ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන මහාලේඛම් ගුරුතුමන් ඇතුලු කාර්යමණ්ඩලයේ සැම හටත් මහාමායාවේ විදුහල්පතිතුමියටත්, සිද්ධාර්ථ මහා විද්‍යාලයේ දයාරත්න හෙල්ලරාව විදුහල්පති තුමා හටත් ඊ.ඒ.ඕ.එල්.එම් ඇරැගොඩ නියෝජ්‍ය විදුහල්පතිතුමිය හටත් මගේ පංතිභාර චාන්දනී බාලසූරිය ගුරුමැණියන් හටත් මාගේ හෘදයාගම ස්තූතිය



**පසුවදන**

රටේ අනාගත සංවර්ධනයට ඉවහල් වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපනය ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් හැකියාවන් ඔපනැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘති යටතේ මේ වන විට ලේඛක අංකුර හැටදහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනය ඵලදායිතාවය වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප පළාත් ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසය එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහමායා බාලිකා විද්‍යාලය විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක් වූ කැපකිරීමට ජාතියේ ප්‍රණාමය හිමි විය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැක.මානව දැනුම ගබඩා කර තැබීමට තේ උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකවද මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගැලපෙමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසග සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින්එයට පිවිසී පුංචි ගත් කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක
සෙනෙවිරත්න මහලේකම්
ISBN අංකය 978-624-208-705-4